# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/01/වා.ස්.මා - 2024
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.11. 30

පළාත් අධ්‍යාපන ලේකම්,

.............................................................

**ජාතික පාසල් සහ පළාත් පාසල් අතර ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2024**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛ අංක 43/2023 අනුව 2024 වර්ෂය සඳහා ජාතික පාසල් අතර, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I / II / III නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදු කිරීමට නියමිත අතර, ඊට සමගාමීව පළාත් පාසල්වල සිට ජාතික පාසල්වලට ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරනු ලබන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් ඔබ පළාතේ සිටී නම් ඒ සඳහා අවස්ථාව ලබාදීමට මේ සමග එවනු ලබන වි.සේ/වා.ස්.මා/පළාත්(01) හි සඳහන් ආකෘතිය අනුව අයදුම්පත් සම්පූර්ණ කර එවන ලෙස ඔබ පළාතේ සිටින ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය http:/www/moe.gov.lk වෙබ් අඩවියේ ද පළකර ඇත.

02. එසේ ලැබෙන අයදුම්පත් මේ සමඟ අමුණා ඇති වි.සේ/වා.ස්.මා/පළාත්**(02)** හා වි.සේ/වා.ස්.මා/පළාත් **(03)** යන ආකෘති අනුව වගුගත කර එම සියලු තොරතුරු 2023.12.31 දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ **ඔබගේ නිර්දේශ හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිර්දේශ සහිතව** එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. එම දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරන බවද කාරුණිකව දන්වමි.

සහකාර ලේකම් (විදුහල්පති ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -
01. සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් - කරු. අදාල තොරතුරු නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා
02. සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් - කරු. අදාල තොරතුරු නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා
03. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් - කරු. අදාල තොරතුරු නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා



CamScanner